# ශ්‍රී ලංකාවේ **කාන්තාවන්** හා
# **හානිපූරණය** පිළිබඳ ලුහුඬු සටහනක්



Centre for Equality and Justice

# ශ්‍රී ලංකාවේ කාන්තාවන් හා හානිපූරණය පිළිබඳ ලුහුඬු සටහනක්

**මාර්තු 2022**

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රයේ (CEJ) පර්යේෂණ තොරතුරු භාවිතා කරමින් සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින් කරන ලද මෙම ලුහුඬු සටහන ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ තත්ත්වය සහ හානිපූරණය පිළිබඳව ජාත්‍යන්තර විශේෂඥයින් දැනුවත් කිරීමට සහ ජාත්‍යන්තර මට්ටමින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ඔවුන්ගේ මැදිහත්වීම් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමට අදහස් කරයි.

## ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්තිය හා සම්බන්ධ බැඳීම්

2015 සැප්තැම්බර් 14 වැනි දින ජිනීවා හි දී පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ (UNHRC) 30 වැනි සැසිවාර විවාදයේ දී එවකට ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යවරයා වශයෙන් කටයුතු කල මංගල සමරවීර මහතා සංක්‍රාන්තික යුක්තිය සඳහා වූ යාන්ත්‍රණයන් හඳුන්වා දෙමින් සිය කතාවේදී[1] මෙසේ පැවසීය: “සත්‍යය සෙවීම, යුක්තිය, හානිපූරණය සහ නැවත සිදු නොවීම යන පුළුල් ක්ෂේත්‍ර ආමන්ත්‍රණය කිරීම සහ නැවත සිදු නොවීම සැබවින්ම අර්ථවත් වීම සඳහා, දෙමළ ජනතාවගේ දුක්ගැනවිලිවලට විසඳුම් ලබා දෙන දේශපාලන විසඳුමකට පැමිණීමේ අවශ්‍යතාවය ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට ඇතුලත් විය යුතු බව ශ්‍රී ලංකා රජය සම්පූර්ණයෙන්ම පිළිගනී.”[2]

ඒ අනුව□ වින්දිතයන්ගේ හානිපූරණය සඳහා වන අයිතිය පිළිබඳව ප්‍රතිඥා දෙමින් ඔහු පවසා සිටියේ “යෝජිත සත්‍යය, යුක්තිය, ප්‍රතිසන්ධානය සහ නැවත ඇති නොවීම පිළිබඳ කොමිෂන් සභාව, අතුරුදන්වූවන්ගේ කාර්යාලය, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව (LLRC) සහ වෙනත් ඕනෑම ආයතනයක් මගින් සිදු කරන ලද වන්දි ගෙවීමට අදාළ නිර්දේශ ක්‍රියාවට නැංවීමට පහසුකම් සැලසීම සඳහා ප්‍රඥප්තිය මගින් හානිපූරණය සඳහා වන කාර්යාලයක් පිහිටුවනු ලබන බවයි.”[3] සත්‍යය, යුක්තිය සහ හානිපූරණය සඳහා වන අයිතිය හා සම්බන්ධ ප්‍රකට ගැටළු විසඳීම සඳහා රජය විසින් යෝජනා කරන ලද ප්‍රධාන යාන්ත්‍රණයන් හතරෙන් එකක් වන්නේ හානිපූරණය සඳහා වන කාර්යාලයයි (OfR) හඳුනාගත් අනෙකුත් යාන්ත්‍රණයන් වූයේ සත්‍යය, යුක්තිය, ප්‍රතිසන්ධානය සහ නැවත ඇති නොවීම පිළිබඳ කොමිෂන් සභාව; අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සඳහා විශේෂ උපදේශකයෙකු සහිත අධිකරණ යාන්ත්‍රණය යනාදියයි.[4]

## ජාතික උපදේශන

තවද, “ක්‍රියාවලීන්හි විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීම සහ ආරක්ෂා කිරීම” සඳහා, ශ්‍රී ලංකා රජය “විපතට පත් වූ සියලුම ප්‍රජාවන්ගෙන් වින්දිතයන් සහ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සිවිල් සමාජය ඇතුළත් කර ගනිමින් පුළුල් ජාතික උපදේශනවල නිරත වීමට කැපවූ අතර එමඟින් මෙම ක්‍රියාවලීන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ජාත්‍යන්තර ප්‍රවීණත්වය, සහාය සහ හොඳම භාවිතයන් මත පදනම්ව සිදුවිය.”[5] මෙම කැපවීමට අනුව එවකට අගමැතිතුමා විසින් සංහිඳියා යාන්ත්‍රණ පිළිබඳ උපදේශන කාර්ය සාධක බලකායක් (CTF) පත් කරන ලදී. එම උපදේශන කාර්ය සාධක බලකා (CTF) වාර්තාව 2017 ජනවාරි මාසයේදී රජයට භාර දෙන ලද අතර, එය අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කරන්නේ කෙසේද යන්න පිළිබඳ දළ සැලැස්මක් ලෙස සැලකිය හැකි අදහස් සහ නිර්දේශවලින් සමන්විත විය.

## හානිපූරණය සඳහා වන කාර්යාලය ස්ථාපිත කිරීමට අදාල නීති

ජාත්‍යන්තර නීතියට අනුව - ශ්‍රී ලංකාව රාජ්‍ය පාර්ශවයක් වන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) ඇතුළුව - මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට තුඩු දී ඇති ක්‍රියාවන් හෝ අතපසුවීම්වල ප්‍රතිවිපාක සඳහා හානිපූරණය කිරීමට ශ්‍රී ලංකාව නීතියෙන් බැඳී සිටී. යුද අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ වැනි සාහසික අපරාධවලට ගොදුරු වූවන් සඳහා හානිපූරණයේ අයිතිය, සම්මුතියේ සහ සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියේ සම්පූර්ණයෙන්ම හෝ ආසන්න වශයෙන් පෙන්වා දී ඇත.[6]

[1] https://www.colombotelegraph.com/index.php/sri-lankas-response-to-unhrc-the-full-text-of-foreign-affairs-ministers-speech-today/
[2] UNHRC 30/1 යෝජනාව
[3] UNHRC 30/1 යෝජනාව
[4] UNHRC 30/1 යෝජනාව
[5] UNHRC 30/1 යෝජනාව
[6] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය, පශ්චාත්-ගැටුම් රාජ්‍යයන් සඳහා නීතියේ ආධිපත්‍ය පිළිබඳ මෙවලම්, හානිපූරණ වැඩසටහන්, (2008).
https://www.ictj.org/sites/default/files/UNHCHR-Global-Reparations-Programmes-2008-English.pdf

මෙම බැඳීම්වලට අනුකූලව□ 2018 මැද භාගයේදී අමාත්‍ය මණ්ඩලය විසින් පනත් කෙටුම්පත අනුමත කර හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) පිහිටුවීම ගැසට් කරන ලදී.[7] කෙසේ වෙතත්, පුළුල් මහජන උපදේශන මත පදනම්ව උපදේශන කාර්ය සාධක බලකාය (CTF) විසින් කරන ලද බොහෝ නිර්දේශ මත ගොඩනැගීමට මෙම පනත් කෙටුම්පත අසමත් විය. හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) පිහිටුවීමේ නීති සම්පාදනය වශයෙන් සිවිල් සමාජය විසින් යෝජිත පනත පිළිබඳ ප්‍රධාන ගැටළු දෙකක් හඳුනා ගන්නා ලදී:

**a** හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලයක් කාර්යාලයට නොතිබුණි. ඇත්ත වශයෙන්ම, යෝජිත කාර්යාලය විසින් සකස් කරන ලද ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කල හැකි වූයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුවය.(වගන්තිය 11(1)(උ))[8]

**b** අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සහ අරමුදල් බෙදා හැරීමට බලය පැවරීම, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය (22(4) වගන්තිය). යෝජිත කාර්යාලයට එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා තමන්ගේම අරමුදලක් ඇති බැවින්, මෙම අතිරික්ත ක්‍රියා පටිපාටි අවශ්‍යතාවය පාර්ලිමේන්තු අධීක්ෂණය වශයෙන් තවත් අනවශ්‍ය පියවරක් එක් කිරීමට සහ හානිපූර්ණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ පිළිබඳ කාර්යාලයේ ස්වාධීනත්වය තවදුරටත් පහත හෙළීමට බලපායි.[9]

සිවිල් සමාජ සංවිධාන ද ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව යෝජිත නීති සම්පාදනය ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ[10] ලබා දී ඇත - උදාහරණ වශයෙන්, “පීඩාවට පත්වූ පුද්ගලයා” යන්නෙහි නිර්වචනය සංශෝධනය කිරීම සහ හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) තුළ ස්වාධීන සහ ඵලදායී සාක්ෂිකරුවන් සහ වින්දිතයින් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

කෙසේ වෙතත්, යෝජිත නීති සම්පාදනයේ කැපී පෙනෙන ධනාත්මක අංග ද තිබුණි:

**1** අවශ්‍යතාවය හඳුනා ගැනීම

**a** පොදු අධ්‍යාපනය, අනුස්මරණ කිරීම සහ ළමුන්, තරුණයින්, කාන්තාවන් සහ ලිංගික හිංසනයට ගොදුරු වූවන් සහ ආබාධිත පුද්ගලයින් පිළිබඳ විශේෂිත ප්‍රතිපත්ති සඳහා;[11]

**b** කාර්යාලයේ සංයුතිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළුව ශ්‍රී ලාංකේය සමාජයේ බහුත්වවාදී ස්වභාවය පිළිබිඹු කරන බව සහතික කිරීම;[12]

**2** කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තම රාජකාරි ඉටු කිරීමේදී අනුගමනය කළ යුතු ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ළමයින් කෙරෙහි සංවේදී නීති රීති නිර්මාණය කිරීමට සහ මාර්ගෝපදේශ නිකුත් කිරීමට[13] සහ ඒ සඳහා නිශ්චිත පුහුණුවක් ලබා දීමටග[14] හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) වෙත බලතල පැවරී ඇති

**3** එහි ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී සහ මාර්ගෝපදේශ නිකුත් කිරීමේදී, හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR)

**a** ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාර දැක්වීම සහ පීඩාවට පත් වූ කාන්තාවන්, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ විශේෂිත අවශ්‍යතා පිළිබඳව කාර්යාලයට උපදෙස් දීමට අදාළ විශේෂඥ දැනුම ඇති උපදේශකයින් සෑම විටම සිටින බව සහතික කිරීමට බැඳී සිටී.[15]

**b** කාන්තාවන්, ළමුන් සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ විශේෂ අවශ්‍යතා නිසි ලෙස සැලකිල්ලට ගනිමින් වෙනස්කම් නොකිරීම,

[7] http://documents.gov.lk/files/bill/2018/6/500-2018_E.pdf
[8] https://www.cpalanka.org/civil-society-raises-concerns-with-the-office-for-reparations-bill/
[9] https://www.cpalanka.org/civil-society-raises-concerns-with-the-office-for-reparations-bill/
[10] https://www.amnesty.org/en/documents/asa37/9219/2018/en/
[11] පනතේ 2 (ආ) වගන්තිය
[12] පනතේ 4(4)(අ) වගන්තිය
[13] පනතේ 11(1)(ඊ) වගන්තිය
[14] පනතේ 11(1)(එ) වගන්තිය
[15] පනතේ 12(1)(ආ) වගන්තිය

විනිශ්චිත-මධ්‍යගතභාවය සහ සාධාරණත්වය යන මූලධර්ම මගින් මඟ පෙන්වනු ලබන බව[16]

c කාන්තාවන්, ළමුන් සහ ආබාධිත පුද්ගලයින් ඇතුළු අවදානමට ලක්විය හැකි පීඩාවට පත් පුද්ගලයින් සඳහා විශේෂ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීම.[17]

## හානිපූරණය සඳහා වන කාර්යාලය ක්‍රියාත්මක වීම

හානිපූරණය සඳහා වන කාර්යාල පනතට[18] අනුකූලව හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) විසින් සම්පාදනය කරන ලද හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශවලට අනුව, හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) විසින් දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහාය ඇතිව මන්නාරම, කිලිනොච්චිය, මුලතිව්, යාපනය, මඩකලපුව, මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල මහජන උපදේශන කටයුතු සිදු කරන ලදී. මෙම මහජන උපදේශන සඳහා සහභාගී වීමට ආරාධනා කරන ලද අගතියට පත් පුද්ගලයින්ගේ කාණ්ඩවලට ඇතුළත් වන්නේ:

- අතුරුදන්වූවන්ගේ මව්වරුන් සහ භාර්යාවන් - කාන්තා ගෘහ මූලිකයන් ද ඇතුළුව
- ගැටුම්, සිවිල් කැලඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා හේතුවෙන් ස්වාමිපුරුෂයන් මිය ගිය කාන්තාවන්
- අභ්‍යන්තරව අවතැන් වූ සහ/හෝ නැවත පදිංචි වූ පුද්ගලයන්; ආබාධ සහිත පුද්ගලයින්
- ගැටුම්, සිවිල් කැලඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා හේතුවෙන් තුවාල ලැබූ පුද්ගලයන් ගැටුම්, සිවිල් කැලඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා හේතුවෙන් මියගිය පුද්ගලයින්ගේ පවුලේ සාමාජිකයන්
- රජයේ සන්නද්ධ හමුදා සහ පොලිසියේ විශ්‍රාමික හෝ ආබාධිත සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්
- රජයේ ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ මියගිය හෝ අතුරුදන් වූ සාමාජිකයින්ගේ පවුල්
- පුනරුත්ථාපනය කර සමාජගත වූ හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකයන්
- ඉන්දියාවෙන් ආපසු පැමිණි සරණාගතයින්
- ගැටුම්, සිවිල් කැලඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා හෝ එහි බලපෑම් නිසා මානසික වශයෙන් පීඩාවට පත් වූ පුද්ගලයන්
- ගැටුම්, සිවිල් කැලඹීම් හෝ දේශපාලන නොසන්සුන්තා අතරතුර දේපළ (චංචල සහ නිශ්චල යන දෙකම) අහිමි වූ පුද්ගලයන්.

එහි හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ලේඛනයේ, හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) විසින් 2019 දෙසැම්බර් මාසයේදී රට පුරා විපතට පත් පුද්ගලයින් නියෝජනය කරන සිවිල් සමාජ සංවිධාන 13ක් සමඟ උපදේශන සිදු කර ඇති බව උපුටා දක්වයි. තවද, එහි ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා අගතියට පත් පුද්ගලයින්ගේ අවශ්‍යතා සහ තත්වයන් පිළිබඳව අදහස් ලබා ගැනීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) කාර්ය සාධන බලකායේ (CTF) සාමාජිකයින් හමුවිය. කාර්ය සාධන බලකායේ (කඔත) අවසන් වාර්තාව සහ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා (LLRC) වාර්තාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම ලේඛනය හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) ට ද අවධානය යොමු කරයි.



[16] පනතේ 12(1)(ඈ) වගන්තිය
[17] පනතේ 12(1)(ඈ)( iii) වගන්තිය
[18] 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාල පනතේ 11(1)(උ) වගන්තිය සමඟ කියවිය යුතු 2(අ) වගන්තියට අනුකූලව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සකස් කරන ලද සහ අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ 2021 (ලේඛනය තවම ප්‍රසිද්ධ කර නැත). සමානාත්මතාවය හා යුක්තිය සඳහා වූ කෙන්ද්‍රය (CEJ) සතුව මෙහි පිටපතක් ඇත.

## වින්දිත ඉල්ලීම් සහ අපේක්ෂාවන් (තෘප්තිය) සපුරාලීම සඳහා කාන්තා විශේෂිත උපදේශනයන්හි අවශ්‍යතාවය

අතුරුදන් වූවන් සෙවීම, කැඩී බිඳී ගිය පවුල් සහ ප්‍රජාවන් පෝෂණය කිරීම සහ යලි ගොඩනැගීමේ ප්‍රයත්නයන් සහ යුක්තිය ඉල්ලා සිටීම ඇතුළු ගැටුම් අතුරතුර සහ පශ්චාත් යුධ කාල වලදී ශ්‍රී ලංකාව තුළ කාන්තාවන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. ගැටුම් අතරතුර බොහෝ ගෘහමූලිකයන් වූ පිරිමින් අතුරුදන් වීම හෝ මරා දැමීම හේතුවෙන්, ගැටුම් කාලවලදී සිදු වූ දරුණු මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් සත්‍යය සහ යුක්තිය සොයන අතරම, කාන්තාවන්ට ඔවුන්ගේ පවුල් රැකබලාග ැනීමේ කාර්යය ද තනිවම කිරීමට සිදුවිය.[19] කෙසේ වෙතත්, අතීතයේ දී හානිපූරණ වැඩසටහන් සැලසුම් කර තිබුණේ කාන්තාවන්ගේ විශේෂිත අවශ්‍යතා සහ සහජ දුර්වලතා පිළිබඳ අවධානය යොමුකිරීමෙන් තොරවය. උදා: ඒවායේ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි විශේෂිත අවධානයක් යොමු කර නොතිබුණි. එබැවින් කාන්තාවන් බොහෝ විට හානිපූරණය සඳහා ප්‍රවේශ වීමට දරන ප්‍රයත්නවලදී හෝ අතුරුදන් වූ ආදරණීයයන් සෙවීමේදී සූරාකෑමට ලක් වූහ - ඇතැමුන් ලිංගික අල්ලස් සහ ලිංගික ප්‍රචණ්ඩත්වයට පවා මුහුණ දෙන ලදි.

ඕනෑම හානිපූරණ යෝජනා ක්‍රමයක් තුළ කාන්තාවන් වෙත විශේෂ අවධානයක් යොමු කළ යුතු වීමට බලපාන හේතු කිහිපයක් තිබේ:[20]

- හානිපූරණයෙන් කාන්තාවන්ට ඔවුන්ගේ ජීවිත සහ ජීවනෝපාය නැවත ගොඩනගා ගැනීමට සහ ඔවුන්ගේ ගෞරවය යළි තහවුරු කරගැනීමට අවශ්‍ය සහය ලබා දේ.
- පිරිමින් විසින් මුහුණ දුන් හා සමාන උල්ලංඝනයන්ට කාන්තාවන් ලක් වූ විට පවා, ඔවුන්ගේ පෙර පැවති සමාජ ආර්ථික සහ නීතිමය තත්ත්වය ප්‍රතිඵල වෙනස් වීමට හේතුවේ.
- ගැටුම් අවස්ථාවන්හිදී හෝ ඉන් පසුව තම පවුල රැකබලා ගැනීමේ සම්පූර්ණ වගකීම කාන්තාවන් වෙත පැවරී ඇත.
- වැන්දඹුවන් ඇතුළු කාන්තා ගෘහ මූලිකයන් ඔවුන්ගේ ප්‍රජාව තුළ කොන් වීමට ලක්විය හැකි අතර ඔවුන්ගේ පවුල් විසින් අත්හැර දැමීම ද සිදුවේ.
- ප්‍රචණ්ඩත්වයට මුහුණ දී දිවි ගලවා ගත් කාන්තා වින්දිතයන් හට පිරිමින්ට සාපේක්ෂව ආර්ථික කටයුතු වලට සම්බන්ධ වීමට ඇති අවස්ථා අවම වීම හේතුවෙන් ඔවුන් තවදුරටත් අසරණභාවයට පත්වේ.

එසේ තිබියදීත්, හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) විසින් එහි ප්‍රතිපත්ති ලේඛනයේ දක්වා ඇති පරිදි සිදු කරන ලද උපදේශන වර්ග ලැයිස්තුවෙන් පෙනී යන්නේ,[21] වින්දිත කාන්තා කණ්ඩායම් කිහිපයක් හැර, හානිපූරණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මානයන් අර්ථවත් ලෙස ග්‍රහණය කර ගැනීම සහ කාන්තාවන්ගේ සමාජ-ආර්ථික, සිවිල් සහ දේශපාලන තත්ත්වය සුව කිරීම, නැවත පිළිසකර කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම උදෙසා කාර්යාලය පුළුල් පරාසයක කාන්තා උපදේශන පවත්වා නොමැති බවයි. උදාහරණයක් ලෙස, හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) විසින් ගැටුම් ආශ්‍රිත ලිංගික හිංසනයෙන් (CRSV) පීඩාවට පත් වූ කාන්තාවන්ගෙ න් උපදෙස් ලබාගෙන නොමැත. එවැනි සංවාද සඳහා කාන්තාවන්ට ඔවුන්ගේ අදහස්, නිර්දේශ සහ අපේක්ෂාවන් නිදහසේ බෙදා ගත හැකි සංවෘත උපදේශන සහිත තනි පුද්ගල හෝ නාභිගත කණ්ඩායම් සාකච්ඡා අවශ්‍ය වේ.

නිදසුනක් වශයෙන්, ගැටුම් ආශ්‍රිත ලිංගික ප්‍රචණ්ඩත්වය, සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් අය විසින් ඉල්ලා සිටින විවිධ ආකාරයේ හානිපූරණයන් වාර්තා වීම අවම වීම සහ ඒවායේ බහුලතාවය හේතුවෙන් කාන්තාවන්ට විශේෂිත වූ උපදේශන අවශ්‍ය වේ. නිදසුනක් වශයෙන්, දිවි ගලවා ගත් වින්දිතයින් සමඟ පවත්වන ලද සම්මුඛ සාකච්ඡා මත පදනම් වූ පර්යේෂණ සොයාගැනීම් වලදී,[22]

[19] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ
[20] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ
[21] සමානාත්මතාවය හා යුක්තිය සඳහා වූ කෙන්ද්‍රය (CEJ) සතුව මෙහි පිටපතක් ඇත.
[22] මා ගතකල ජීවිතය: ශ්‍රී ලංකාවේ ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් දිවි ගලවා ගත් වින්දිතයන් සඳහා වන හානිපූරණයන් අවබෝධ කර ගැනීම, CEJ

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය හානිපූරණයන් වශයෙන් සැලකෙන අපේක්ෂාවන් රාශියක් හඳුනාගෙන ඇත. එම ඇතැම් සොයාගැනීම් පහත විස්තර කෙරේ.

## උල්ලංඝනය කිරීම් වර්ග

දකුණ, උතුරුමැද, වයඹ, නැගෙනහිර සහ උතුරු පළාත්වල යුද්ධයෙන් පීඩාවට පත් සිංහල, දෙමළ සහ මුස්ලිම් කාන්තාවන් 25 දෙනෙකු සමඟ සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින් කරන ලද අධ්‍යයනයක සොයාගැනීම්වලට අනුව,[23] අධ්‍යයනය සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූවන් විසින් අත්විඳින ලද උල්ලංඝනයන් වර්ග කිහිපයක් මෙසේ හඳුනාගන්නා ලදි:

1. අභ්‍යන්තර අවතැන් වීම
2. පවුලේ සාමාජිකයන් වීම හෝ අතුරුදහන් වීම
3. ළමයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම
4. ශාරීරික හා මානසික ආබාධ
5. ජීවනෝපාය අහිමි වීම
6. ඉතා අඩු වයසින් දරුවන් - විශේෂයෙන්ම ගැහැණු ළමයින් - විවාහ කර දීමට සිදුවීම
7. තම නිවස, ඉඩම සහ උපන් ගම අත්හැර යාමට සිදුවීම
8. බලහත්කාරී ඉඩම් කොල්ලය
9. අධ්‍යාපනයට ප්‍රවේශ වීම සඳහා ඇති බාධා

## දිවි ගලවා ගත් වින්දිතයින් විසින් බලාපොරොත්තු වන හානිපූරණය

සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය (CEJ) විසින් මෙම දිවි ගලවා ගත් වින්දිතයින් විසින් අපේක්ෂා කරන හානිපූරණයන්ගේ ප්‍රධාන අංශ තුනක් පුළුල් ලෙස හඳුනාගෙන ඇත.

**මූල්‍ය වන්දි සහ සේවා :**

ඔවුන්ගේ වර්තමාන තත්වයන් හේතුවෙන්, කාන්තාවන්ගෙන් බහුතරයක් තමන්ගේ මෙන්ම තම පවුලේ සාමාජිකයින්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මූල්‍ය වන්දි සහ සේවාවන් ලබාගැනීම සඳහා කැමැත්ත පළ කළහ. කාන්තාවන්ගේ පොදු ඉල්ලීම් අතර නිවසක් තනා ගැනීමට ආධාර, වෛද්‍ය සහ මනෝවිද්‍යාත්මක සේවා, පවුලේ සාමාජිකයෙකුට රැකියාවක් හෝ ඔවුන්ගේ දරුවන්ට අධ්‍යාපනය වැනි සේවාවන් ඇතුළත් විය.

**සත්‍යය, තෘප්තිය, සංකේතාත්මක හානිපූරණය සහ නැවත සිදුනොවීම:**

කාන්තාවන් ප්‍රකාශ කළේ තම අතුරුදන් වූ ආදරණීයයන් සම්බන්ධ තොරතුරු, තෘප්තිය, සංකේතාත්මක හානිපූරණය සහ රජය විසින් නැවත සිදු නොවන බවට වන සහතික තමන් අපේක්ෂා කරන බවයි.

**තනි පුද්ගල සහ සාමූහික හානිපූරණය :**

ඔවුන් කැමති තනි පුද්ගල හානිපූරණයට ද නැතහොත් සාමූහික හානිපූරණයට දැයි විමසූ විට, බොහෝ කාන්තාවන් තනි පුද්ගල සහ සාමූහික යන හානිපූරණයන් දෙවර්ගයම ලබා දීමේ වැදගත්කම ප්‍රකාශ කළේ, උල්ලංඝනයන්හි පරිමාණය අතිවිශාල බැවින් සහ විශාල පිරිසක් පීඩාවට පත්ව ඇති බැවිනි.

පහත කොටසින් මෙම අපේක්ෂාවන් සවිස්තරාත්මකව දැක්වේ.



[23] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ

## වන්දි

වන්දි යනු කිසියම් ආර්ථික අර්ථයකින් ගිණුම්ගත කළ හැකි උල්ලංඝණයන් හේතුවෙන් සිදුවන හානි සඳහා කරන ලද මූල්‍ය ප්‍රදානයන් වේ. උදාහරණ වශයෙන් :

- ශාරීරික හා මානසික හානිය
- රැකියා, අධ්‍යාපනය සහ සමාජ ප්‍රතිලාභ ඇතුළුව අහිමි වූ අවස්ථා
- ඉපැයීමේ විභවය අහිමි වීම ඇතුළුව ද්‍රව්‍යමය හානි සහ ඉපැයීම් අහිමි වීම
- සදාචාරාත්මක හානිය
- නීතිමය හෝ විශේෂඥ සහාය, ඖෂධ සහ වෛද්‍ය සේවා, සහ මනෝවිද්‍යාත්මක සහ සමාජ සේවා වලට අදාල වියදම්.[24]

## පුනරුත්ථාපනය

පුනරුත්ථාපනය මඟින්

- දිවි ගලවා ගත් වින්දිතයන් හට අවශ්‍ය කායික හා මානසික සෞඛ්‍ය රැකවරණය සහ නීතිමය සහ සමාජ සේවා සඳහා ප්‍රවේශය ලබා දීම.[25]
- පුද්ගලයා, පවුල, ප්‍රාදේශීය ප්‍රජාව සහ සමස්තයක් වශයෙන් සමාජය පවා ආමන්ත්‍රණය කිරීමෙන් උපරිම ශාරීරික හා මානසික යෝග්‍යතාවය ලබා දීම[26] අපේක්ෂා කරයි.

සාරාංශයක් ලෙස, එය හානිය ප්‍රතිපූරණය කිරීම අරමුණු කරයි, සහ එයට:

- වෛද්‍ය සහ/හෝ මනෝ සමාජීය සහාය සඳහා ප්‍රවේශය
- නිවාස යෝජනා ක්‍රම, දරුවන් සඳහා රැකියා සහ මුදල් වන්දි වැනි ආර්ථික ආධාර
- ආගමික කටයුතුවල නියැලීමට, දරුවන්ට අධ්‍යාපනය ලබා දීමට, අතුරුදන් වූ ආදරණීයයන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට ඇති නිදහස
- නැවත සිදු නොවන බවට රජයේ විසින් සහතික වීමක්[27] ඇතුළත් වේ

## තෘප්තිය

තෘප්තිය යන්නට හානිපූරණයේ සංකේතාත්මක ආකාරයන් විශාල ප්‍රමාණයක් අඩංගු වේ. ඒවා නම්,

- අනුස්මරණය කිරීම හා සිහිපත් කිරීම
- ජනතාවගෙන් සමාව අයැද සිටීම
- සත්‍ය සෙවීම
- උල්ලංඝනයන් සිදු කරන්නන්ට එරෙහිව අධිකරණ සහ පරිපාලන සම්බාධක පැනවීම
- තොරතුරු තහවුරු කිරීම සහ අතුරුදන්වූවන් සෙවීම[28]

[24] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ
[25] ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ බරපතල උල්ලංඝනයන් සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ බරපතල උල්ලංඝනය කිරීම්වලට ගොදුරු වූවන් සඳහා පිළියමක් සහ වන්දි ගෙවීමේ අයිතිය පිළිබඳ මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ
[26] ඩීනා ෂෙල්ටන්, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ පිළියම් (Oxford University. Pres, 2005)
[27] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ
[28] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ

## සංකේතාත්මක වන්දි

දකුණු අප්‍රිකානු සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසමට (TRC) අනුව, සංකේතාත්මක වන්දි යනු **"අතීතයේ වේදනාවන් සහ ජයග්‍රහණ සිහිපත් කිරීමේ සහ සැමරීමේ වාර්ගික ක්‍රියාවලියට"** පහසුකම් සපයන පියවරයන් වේ.[29] වින්දිතයන්ගේ සහ දිවි ගලවා ගත් අයගේ ගෞරවය යළි ස්ථාපිත කිරීමේ යාන්ත්‍රණයන් ලෙස සැලකිය හැකි එවැනි ක්‍රියාමාර්ග අතරට කරුණු සත්‍යාපනය කිරීම, අතුරුදන්වූවන් සෙවීම සහ සැමරුම්, උපහාර සහ මහජන සමාව අයැදීම යනාදිය ඇතුළත් වේ.[30]

## අනුස්මරණය කිරීම

අනුස්මරණය යනු අතීත අපයෝජනයන් හා සමථයකට පත්වීමේ සහ මියගිය ආදරණීයයන්ට ගෞරව කිරීමේ, ඔවුන් හඳුනා ගැනීමේ සහ මතක තබා ගැනීමේ අනිවාර්ය අංගයකි.[31] දිවි ගලවා ගත් වින්දිතයන් විසින් ලැයිස්තුගත කර ඇති එවැනි ක්‍රියාකාරකම් කිහිපයක් පහත පරිදි වේ.

+ ආගමික උත්සව සහ කටයුතු වලට සහභාගී වීම
+ ජාතික අනුස්මරණ දිනයක් ප්‍රකාශයට පත් කිරීම
+ ප්‍රාදේශීය හා ජාතික මට්ටමින් ස්මාරක සහ සිහිවටන ඉදිකිරීම
+ පොදු ස්ථාන සහ මාර්ග වින්දිතයන්ගේ නමින් නම් කිරීම
+ අනෙකුත් කාන්තාවන් සහ පවුල් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සහ බෙදාගැනීම
+ සාමූහිකව රජයෙන් පිළිතුරු සහ යුක්තිය ඉල්ලා සිටීම

## සමාව ඉල්ලීම

සමාව ඉල්ලීම සංකේතාත්මක හානිපූරණයේ වැදගත් ආකාරයකි. සමාව ඉල්ලීම යනු මානව හිමිකම් කඩකිරීම් අතීතයේ සිදු වූ බවත්, එවැනි උල්ලංඝනයන් වින්දිතයින්ට බරපතල සහ බොහෝ විට යථා තත්වයට පත්කල නොහැකි හානියක් සිදු කළ බවත් පිළිගැනීම සහ සමාව ඉල්ලා සිටින රාජ්‍යය, කණ්ඩායම හෝ තනි පුද්ගලයා සිදු වූ දෙයට පූර්ණ වශයෙන් හෝ යම් ප්‍රමාණයකට වගකීම භාර ගැනීමත් වේ.[32] සමාව අයැදීම සැබවින්ම අර්ථාන්විත සහ වැදගත් වීම සඳහා වෙනත් ආකාරයේ වන්දි ගෙවීම් සමඟ ඒකාබද්ධ කිරීමේ වැදගත්කම කාන්තාවන් අවධාරණය කළහ. තමන් මුහුණ දී ඇති බරපතළ උල්ලංඝනයන් සම්බන්ධයෙන් සමාව ඉල්ලීම පමණක් ප්‍රමාණවත් නොවන බව ඔවුහු පෙන්වා දුන්හ. ඇතැමුන් තමන්ගෙන් පුද්ගලිකව සමාව ගැනීම පිළිබඳ කැමත්ත එල කල අතර ඇතැමුන් කියා සිටියේ ප්‍රසිද්ධියේ සමාව ගැනීම සිදුකල යුතු බවයි.[33]

## සත්‍යය සෙවීම සහ යුක්තිය

සත්‍ය සෙවීමේ කොමිසම් නිශ්චිත කාල සීමාවක් තුළ සිදු වූ මානව හිමිකම් කඩවීම් පිළිබඳ අතීත රටාවන් විමර්ශනය කිරීමේ යාන්ත්‍රණයකි. ප්‍රචණ්ඩකාරී ගැටුම් වාතාවරණයක සිට පශ්චාත් යුධ කාලීන සාමය ගොඩනැගීම දක්වා ගමන් කිරීමට එවැනි කොමිෂන් සභා උපකාරී වේ. මෙම කොමිෂන් සභාවලට අතීතයේ සිදු වූ උල්ලංඝනයන් පිළිබඳව දැනුවත් කිරීම, වින්දිතයින්ට සහනයක් ලබා දීම සහ එම උල්ලංඝනයන් කෙරෙහි අවධානය යොමු කර අනාගතයේදී එවැනි දෑ යලි සිදු වීම වැළැක්විය හැකි බවට බලාපොරොත්තුවක් ලබා දිය හැකිය. යුක්තිය ඉල්ලා සිටින අතරවාරයේ බහුතරයක් කාන්තාවන් පෙන්වා දුන්නේ තමන් පොලිසියට පැමිණිලි කළ බවත්, කොමිෂන් සභා කිහිපයකට තොරතුරු ලබා දුන් බවත්, ග්‍රාම නිලධාරී හමුවට ගිය බවත්, මානව

[29] හානිපූරණය සහ පුනරුත්ථාපන ප්‍රතිපත්තිය පිළිබඳව වන දකුණු අප්‍රිකාවේ සත්‍යය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කමිටු අවසන් වාර්තාව, 5 වන වෙළුම, 5 වන පරිච්ඡේදය, <https://omalley.nelsonmandela.org/omalley/index.php/site/q/03lv02167/04lv02264/05lv02335/06lv02357/07lv02398/08lv02403.htm>
[30] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ
[31] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ
[32] ICTJ, 'වචනවලට වැඩි යමක්: සමාව අයැදීම හානිපූරණයේ ආකාරයක් ලෙස. (ICTJ, 2016) <https://www.ictj.org/publication/more-than-words-apologies-form-reparation>
[33] අහිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ

හිමිකම් කොමිෂන් සභාවට, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට සහ අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයට පැමිණිලි කළ බවත්ය. නමුත් ඔවුන්ට අද දක්වා කිසිදු සාධාරණයක් ඉටුවී නොමැත.[34]

## නැවත සිදු නොවන බවට සහතික වීම

අනාගත උල්ලංඝනයන් වැලැක්වීම කෙරෙහි අවධානය යොමු කරන නැවත සිදු නොවන බවට වන සහතික කිරීම් - පළිගැනීම් හෝ අනාගතයේ දී හිරිහැර සිදුවන ඇතැයි බියෙන් සිටින වින්දිතයින්ට සහතිකයක් ලබා දීම සඳහා තීරණාත්මක වේ. සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය CEJ විසින් සිදුකරන ලද අධ්‍යයනයට සහභාගී වූ දිවි ගලවා ගත් වින්දිතයින් විසින් බලාපොරොත්තු වූ ඇතැම් සහතික වීම් පහත පරිදි වේ:

+ උල්ලංඝනය කිරීම් නැවත සිදු වීම වැළැක්වීම සඳහා නීති සමාලෝචනය කිරීම සහ කෙටුම්පත් කිරීම සහ මෙම නීති ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම
+ බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ නඩු විභාගයන්හි ප්‍රමාදයන් වැළැක්වීම සහ ඒවා කඩිනම් කිරීම
+ අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම

  නීතියෙන් ලබා දී ඇති දඬුවම් දැඩි ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීම
+ දේශපාලන මතය සහ මතවාදය මත පදනම් වූ පීඩා වැළැක්වීම
+ පොලිස් බලකාය සහ ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණය කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම
+ නීති රාමු සහ ප්‍රතිපත්ති පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම් සහ තොරතුරු සැසි නිර්මාණය කිරීම
+ අතීත උල්ලංඝනයන් පිළිබඳ නිවැරදි තොරතුරු සහතික කිරීම සඳහා සත්‍ය පිළිබඳ කොමිෂන් සභා වැනි ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත කිරීම
+ රටේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය ශක්තිමත් කිරීම
+ අතීත අපයෝජනයන් අනාගත පරම්පරාවන් වෙත නොපැමිණීම සහතික කිරීම සඳහා වන්දි සහ විසඳුම් ලබා දීමට කඩිනම් පියවර ගැනීම.
+ ජාතිය, ආගම හෝ භාෂාව මත පදනම්ව වෙනස්කම් කිරීමකින් තොරව සියලුම පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් සහතික කිරීම
+ කිසිදු භේදයකින් තොරව නීතිය ඉදිරියේ සමානාත්මතාවය සහ නීතියේ සමාන ආරක්ෂාව සහතික කිරීම.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ කටයුතු කරන සංවිධාන සහ සාමාන්‍ය ජනතාව අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ වැදගත්කම සහ හානිපූරණයේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් නොමැතිකම දිවි ගලවා ගත් වින්දිතයින්ගේ තත්වය තවත් උග්‍ර කළ හැකිය. එබැවින් පුළුල් පරාසයක වින්දිත කණ්ඩායම් සමඟ සහ ඉතා විස්තරාත්මකව උපදේශනයන් සිදු කළ යුතුය.

## 2020 දී සංක්‍රාන්තික යුක්තිය සඳහා වූ කැපවීමෙන් රජය ඉවත් වීම සහ නව අභියෝග

2019 නොවැම්බරයේ ආණ්ඩු මාරුවෙන් පසු, ශ්‍රී ලංකා විදේශ අමාත්‍යවරයා විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 යෝජනාවට සහය ලබාදීමෙන් ඉවත් වන බව නිවේදනය කළේය.[35] එම අවස්ථාවේ දී යෝජනාවට අනුකූලව දැනටමත් පිහිටුවා ඇති යාන්ත්‍රණවල ඉදිරි කටයුතු පිළිබඳ අවිනිශ්චිත බවක් ඇති විය.

[34] අභිමිවූවන් පිළිබඳ මතක: ශ්‍රී ලංකාවේ කාන්තාවන් සහ හානිපූරණය පිළිබඳ සිද්ධි අධ්‍යයන 25ක්, CEJ
[35] https://mfa.gov.lk/43rd-session-hrc/

තවද, 2020 ඔක්තෝබර් මාසයේදී නව රජය ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 20 වැනි සංශෝධනය සම්මත කරන ලදී.[36]

මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට එරෙහිව ආරක්ෂාවක් ලෙස හෝ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සඳහා පිළිසරණක් ලෙස ක්‍රියා කිරීමට බලය ඇති ප්‍රධාන ස්වාධීන ආයතනවලට දේශපාලන මැදිහත්වීම් වලින් තොරව පත්වීම් ලබාදීමේ හැකියාව මෙම සංශෝධනය මගින් ඉවත් කරන ලදී. සංශෝධනය යටතේ, හානිපූරණය සඳහා වන කාර්යාලයට (OfR) ජනාධිපතිවරයා විසින් සෘජුවම පත්වීම් ලබාදීම සිදු කරනු ලබන අතර, පාර්ලිමේන්තු සභාවට කල හැකි වන්නේ පත්වීම් පිළිබඳ ඔවුන්ගේ බැඳීම් රහිත නිරීක්ෂණ ජනාධිපතිවරයා වෙත ලබා දීම පමණි.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ (OfR) සාමාජිකත්වය සඳහා නව නාමයෝජනා ලබා දී ඇති බව වාර්තා වන නමුත්[37], කාර්යාලයේ නිල වෙබ් අඩවියේ ඒවා පිළිබිඹු නොවේ.[38]

## හානිපූරණය සඳහා වන කාර්යාලය (OfR) වෙත කෙරෙන නිර්දේශ

- හදිසි අවශ්‍යතාවයක් ලෙස - විශේෂයෙන් කාන්තාවන්ට - හඳුනාගෙන අතුරු හානිපූරණයන් ලබා දීම
- මානව හිමිකම් උල්ලංඝනයන්ට ගොදුරු වූවන් සඳහා විස්තර කර ඇති පරිදි පූර්ණ සහ පුළුල් පරාසයක හානිපූරණයන් ලබා දීම
- පනත මගින් සපයා ඇති ඔවුන්ගේ වරම හැකිතාක් පුළුල් ලෙස අර්ථ දැක්වීම
- වැඩිම ප්‍රතිලාභීන්/විපතට පත් පුද්ගලයින් කණ්ඩායමට හානිපූරණයන් ලබා දීම
- එහි සියලුම මෙහෙයුම් වලදී සමානාත්මතාවය සහ විනිවිදභාවය යන මූලධර්මය යටතේ ක්‍රියා කිරීම
- හානිපූරණ ප්‍රතිපත්තිය එහි වෙබ් අඩවියේ සහ වෙනත් ක්‍රම මගින් ප්‍රසිද්ධ කිරීම
- හානිපූරණයන් ලබා ගැනීමේ හැකියාව පිළිබඳව මහජන අදහස් ලබා ගැනීම
- වරමට අනුව වඩා හොඳින් සේවය කිරීම සඳහා, විශේෂයෙන් දිවි ගලවා ගත් වින්දිත කාන්තාවන් සමඟ නිතිපතා උපදේශන පැවැත්වීම අඛණ්ඩව කරගෙන යැම
- උපදේශන කාර්ය සාධක බලකායේ සොයාගැනීම් සහ නිර්දේශ මගින් මඟ පෙන්වීම
- ධාරිතා ගොඩ නැගීම සහ තාක්ෂණික සහාය සඳහා හානිපූරණ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සහාය ලබා ගැනීම.

## ශ්‍රී ලංකා රජය වෙත ලබාදෙන නිර්දේශ

- හානිපූරණයේ ස්වරූපය සහ ප්‍රමාණය ඇතුළුව හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ අනුමත කිරීමේදී දිවි ගලවා ගත් වින්දිතයන්ගේ අවශ්‍යතා අනුව අමාත්‍ය මණ්ඩලය කටයුතු කරන බවට සහතික වීම.
- හානිපූරණය සඳහා වන කාර්යාලයේ (OfR) හි කටයුතු සඳහා වාර්ෂික අයවැය හරහා ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම
- සෑම ආකාරයකම අනුස්මරණ කිරීම් සඳහා අවකාශය නිර්මාණය කිරීම ඇතුළුව හානිපූර්ණ මුලපිරීම් සඳහා ක්‍රියාකාරීව සහාය වීම. නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සහය ද මේ සඳහා ලබා දිය යුතුය
- ආරක්ෂක අංශ සඳහා වන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

[36] http://documents.gov.lk/files/act/2020/10/00-2020_E.pdf
[37] https://twitter.com/ParliamentLK/status/1395393686322618377?s=20
[38] https://www.reparations.gov.lk/web/index.php?lang=en

- ප්‍රමාණවත් සාක්ෂි ඇති මානව හිමිකම් උල්ලංඝන සිද්ධීන් සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණ සිදුකිරීමට නීතිපති දෙපාර්තමේන්තුවට අවසර ලබා දීම

## ජාත්‍යන්තර ප්‍රජාව වෙත ලබාදෙන නිර්දේශ

- ශ්‍රී ලංකාවේ හානිපූරණ ක්‍රියාවලිය සහ එහි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම

- දිවි ගලවා ගත් වින්දිතයන් සියලුම දෙනා ප්‍රතිලාභීන්/අගතියට පත් වූවන් ලෙස ඇතුළත් කර ගැනීම සඳහා ක්‍රියාකාරීව බලපෑම් කිරීම

- පනතට අනුකූලව පරිත්‍යාග, ප්‍රදාන හෝ ත්‍යාග මඟින් හානිපූරණය සඳහා වන කාර්යාලයේ (OfR) කාර්යයන්ට සහාය වීම.

**සමානාත්මතාවය සහ යුක්තිය සඳහා වූ කේන්ද්‍රය**

නො. 325 A 1, තිඹිරිගස්යාය පාර, කොළඹ 05,

ශ්‍රී ලංකාව

දුරකථන/ ෆැක්ස්: +94 11 2055404

www.cejsrilanka.org | srilanka.cej@gmail.com

/Centre-for-Equality-and-Justice

/CEJ_SriLanka

/cej_srilanka

/channel/CEJ Sri Lanka